**පිවිතුරු සහ පුනර්ජනනීය බලශක්ති ප්‍රවේශය සඳහා කාන්තා සහභාගීත්වය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2016**

---

පිවිතුරු සහ පුනර්ජනනීය බලශක්ති ප්‍රවේශය සඳහා කාන්තා සහභාගීත්වය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2011 අගෝස්තු 29 දින එළඹි අංක 9158 දරන ප්‍රදාන ගිවිසුමේ 11 (අ) හා (ආ) වගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය**

---

ව්‍යාපෘතියේ ගිවිසුම්ගත ලිපිය අනුව, ලංකා විදුලි බල මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය ප්‍රජාව සඳහා පිරිසිදු බලශක්ති ප්‍රවේශය වැඩි කිරීම සහ ලංකා විදුලි බල මණ්ඩලයේ පුහුණු හැකියාවන් හා සේවා බෙදාහැරීම වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ප්‍රදාන ක්‍රියාත්මක කිරීමේ අත්පොතේ (vii) 33 වගන්තිය ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 142 කට සමාන එ ජ ඩො මිලියන 1.08 ක් වන අතර ඉන් එ ජ ඩො 873,975 ක් දිළිඳුකම අඩුකිරීම සඳහා ජපන් අරමුදල (JFPR) මඟින් මූල්‍යායනය කිරීමට අපේක්ෂා කර තිබුණි. තවද, එ ජ ඩො 211,200 ක් ඊ්ටීසී (ETC) පදනම විසින් මූල්‍යායනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2011 නොවැම්බර් 08 දින ආරම්භ කරන ලද අතර 2014 නොවැම්බර් 08 දින වන විට නිම කිරීමට ආරම්භයේදී සැලසුම් කර තිබුණි. පසුව එය 2017 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දැ

තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩි දියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ප්‍රදාන සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදානවලින් කරන මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් සහ එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලබන පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව.

(ඊ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(උ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඌ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඒ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඔ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන
-----------------

### 2.1 මතය
--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් සහ එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලබන පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව.

(ඈ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ප්‍රදාන ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.මිලියන 66.40 ක් වූ සේවා සම්බන්ධතා ගාස්තු එහි පුනරාවර්තන ස්වභාවය සැලකිල්ලට ගැනීමෙන් තොරව දේපල, පිරියත හා උපකරණ යටතේ ප්‍රාග්ධනීත කර තිබුණි.

(ආ) ලංකා විදුලිබල මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව, ප්‍රාග්ධන වැඩවලට අදාළ ශ්‍රමය, ද්‍රව්‍ය හා පොදුකාර්ය වියදම් ප්‍රමිත පිරිවැය ක්‍රමය පදනම් කරගෙන තීරණය කර තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතියේ දේපල, පිරියත හා උපකරණවල හා කෙරීගෙන යන වැඩවල ඇතුළත් සේවා සම්බන්ධතා පිරිවැය තථ්‍ය පිරිවැය පදනම් කරගෙන තීරණය කර තිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

ප්‍රදාන නියෝජිතායතනයෙන් අයකර ගැනීමට අපේක්ෂිත ලංකා විදුලිබල මණ්ඩලය විසින් සේවා සම්බන්ධතා මත දරන ලද රු.මිලියන 17.22 ක් වූ පිරිවැය ලංකා විදුලිබල මණ්ඩලය විසින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ප්‍රාග්ධනය යෙදවීම් යටතේ අදාළ නොවන පරිදි දක්වා තිබුණි.

**2.2.3 නොසැසඳූ ශේෂය**

ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වා ගෙන යන ලද අග්‍රිම අරමුදල් ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට පැවති රු.120,473 ක් වූ ශේෂය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ව්‍යාපෘතිය වෙනුවෙන් තහවුරු කරන ලද රු.553,963 ක ශේෂය සමඟ එකඟ වී නොතිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2016 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුම් අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2016 දෙසැම්බර් 31 දිනට | |
| | එ ජ ඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එ ජ ඩො මිලියන | රු. මිලියන | එ ජ ඩො මිලියන | රු.මිලියන |
| ආ ස බැ | 1.08 | 142 | 78 | 0.045 | 6.6 | 0.62 | 90.3 |
| **එකතුව** | **1.08** | **142** | **78** | **0.045** | **6.6** | **0.62** | **90.3** |

**3.2 භෞතික ප්‍රගතිය**

ලැබුණු තොරතුරු අනුව, ව්‍යාපෘති කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා විස්තරාත්මක සැලැස්ම පිළියෙල කර නොතිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස, ඉටුකරගත යුතු වාර්ෂික ඉලක්ක තීරණය කර නොතිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළ සිදුකරන ලද ගෘහ ඒකක සම්බන්ධතාවයන් 1,235 ක් ඇතුළත්ව 2016 දෙසැම්බර් 31 දිනට ගෘහ ඒකක 2,911 ක් සඳහා සේවා සම්බන්ධතා ලබා දී තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය අවසානයට ගෘහ ඒකක 290 ක් සඳහා සේවා සම්බන්ධතාවන් කෙරීගෙන යමින් පැවතුණි. කෙසේ වුවද, 2016 දෙසැම්බර් 31 දිනට සේවා සම්බන්ධතා 4,325 ක් ලබා දී ඇති බව ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තාවේ දක්වා තිබුණි.

**3.3** **මූල්‍ය පාලන පිළිබඳ ගැටලු**

**--------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රදාන ක්‍රියාත්මක කිරිමේ අත්පොතේ 4 වන පරිශිෂ්ටයේ සී(10) කොටසේ අවශ්‍ය පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ කටයුතු ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශයේ විගණනය සඳහා භාජනය කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 626 අනුව, එක් එක් ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වෙනම ගිණුම් වාර්තා පදනම් කරගෙන පිළියෙල කල යුතුය. කෙසේ වුවද, ව්‍යාපෘතියේ ලැබීම් හා ගෙවීම් සටහන් කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් වෙනම ලෙජර ගිණුම් කට්ටලයක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර ඉහත සඳහන් අවශ්‍යතාවයට පටහැනිව ලංකා විදුලිබල මණ්ඩලයේ පොදු ලෙජරයෙන් උපුටා ගන්නා ලද සංඛ්‍යා පදනම් කරගෙන ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.